// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2144/53 – 2019 ඔක්තෝබර් මස 10 වැනි බ්‍රහස්පතින්දා – 2019.10.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස – පළාත් සභා

## පළාත් සභා නිවේදන

### ඌව පළාතේ පළාත් සභාව

නිවේදනයයි

ඌව පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍ය දොන් ආතර් චාමර සම්පත් දසනායක වන මා විසින් 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතෙහි 2 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 223 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පහත විධාන පනවනු ලැබේ.

දොන් ආතර් චාමර සම්පත් දසනායක,
ඌව පළාතේ ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රම සම්පාදන,
නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන,
ඉඩම්, විදුලිබල හා බලශක්ති, ඉදිකිරීම්,
ග්‍රාමීය යටිතල පහසුකම් අමාත්‍ය.
ඌව පළාත.

වර්ෂ 2019 ක් වූ සැප්තැම්බර් මස 04 වැනි දින,
ඌව පළාත් ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

1A – PG 4684 – 18 (2019/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**විධාන**

01. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ පිහිටුවන ලද යම් පළාත් පාලන ආයතනයක පාලනය යටතේ පැවති යම් පරිපාලන ප්‍රදේශයක යම් කොටසකින් එකී පනත යටතේ ම නව ප්‍රාදේශීය සභාවක් සංස්ථාපනය කරන ලද අවස්ථාවක දී එකී නව ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කරන ලද දින සිට ඒ පරිපාලන ප්‍රදේශය සම්බන්ධ සියලු කාර්යයන් සඳහා ඒ නව ප්‍රාදේශීය සභාව ඒ පළාත් පාලන ආයතනයේ අනුප්‍රාප්තිකයා විය යුතු ය.

02. 1 වන වගන්තියෙන් සඳහන් කරන ලද යම් ප්‍රාදේශීය සභාවක් සඳහා එම ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කරන ලද දිනයේ සිට බලපැවැත්වෙන පරිදි ;

(අ) 1 වන වගන්තියෙහි සඳහන් පළාත් පාලන ආයතනයට අයත් වූ ද ඒ ප්‍රදේශය ඇතුළත පිහිටා තිබිය හැකි වූ ද, ඒ පළාත් පාලන ආයතනයේ අරමුදල් නොවන සියලු දේපල ;

(ආ) එම පළාත් පාලන ආයතනයේ සියලු අයිතිවාසිකම්, බලතල, කාර්යය, ණය, වගකීම් සහ බැඳීම්, ඒවා අදාළ ප්‍රදේශය ඇතුළත ඒ ප්‍රදේශයට අදාළ වන ප්‍රමාණයට,

එම සභාවට පවරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

03. ප්‍රාදේශීය සභා පනතින් අන්‍යාකාරයකින් විධිවිධාන සලස්වනු ලැබ ඇති ප්‍රමාණයකට හැර යම් පළාත් පාලන ආයතන පංතියක් ගැන හෝ එක්තරා විශේෂිත පළාත් පාලන ආයතනයක් ගැන යම් ප්‍රඥප්තියක හෝ ඒ යටතේ සාදන ලද යම් නියමයක, රීතියක, නියෝගයක හෝ අතුරු ව්‍යවස්ථාවක හෝ ඒ අනුව ලියා අත්සන් කරන ලද හෝ නිකුත් කරන ලද යම් ලේඛනයක හෝ සාධන පත්‍රයක කර ඇති සියලු සඳහන් කිරීම්, ඒවා මෙම ප්‍රාදේශීය සභා පනත යටතේ සංස්ථාපනය කරනු ලැබූ ප්‍රාදේශීය සභා ගැන කරන ලද සඳහන් කිරීම් ලෙස හෝ එක්තරා විශේෂිත පළාත් පාලන ආයතනයක් ගැන කර ඇති සඳහන් කිරීමක් සම්බන්ධයෙන් වන විට ඒ පළාත් පාලන ආයතනය අනුප්‍රාප්තිකයා වන ප්‍රාදේශීය සභාව ගැන කරන ලද සඳහන් කිරීමක් ලෙස, එකී යම් සභා හෝ සභාවක් සංස්ථාපනය කරන ලද දිනයේ සිට ප්‍රශ්නයට භාජනයව ඇති කාරණයේ කාර්යයන් සඳහා තේරුම් ගත යුතු ය.

04. ස්වකීය බලතල සහ කාර්යය ප්‍රාදේශීය සභා පනත යටතේ ම නව ප්‍රාදේශීය සභාවක් වෙත පවරනු ලැබුයේ යම් පළාත් පාලන ආයතනයක ද ඒ පළාත් පාලන ආයතනයේ හෝ ඊට බලපාන සහ පැවරීම කෙරෙන අවස්ථාවේ බලාත්මකව තිබූ ප්‍රකාශන, නියම, නිවේදන, රීති, නියෝග සහ අතුරු ව්‍යවස්ථා සියල්ල එසේ පවරන ලද බලතලවලට සහ කාර්යයන්ට ඒවා අදාළ වන තාක්දුරට හෝ ඒවායේ බලතලවලට සහ කාර්යයන්ට අනුව වන තාක් දුරට හෝ ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කරන ලද යම් ප්‍රදේශය ඇතුළත ඇති යම් කාරණයකට හෝ දෙයකට ඒවා අදාළ වන තාක් දුරට නොකඩවා බලාත්මකව තිබිය යුතු ය.

05. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් යම් ප්‍රාදේශීය සභාවක් වෙත පවරන ලද යම් බලතල කාර්යය, බැඳීම් හෝ දේපල සම්බන්ධයෙන් යම් පළාත් පාලන ආයතනයක ප්‍රතිලාභය සඳහා හෝ ඊට විරුද්ධව ඒ ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කරන ලද දිනයේ දී අවසන් නොවී ඇති හෝ පවත්නා යම් නඩුවකට හෝ නීති කෘත්‍යයකට හෝ යම් නඩුවක හෝ නීති කෘත්‍යයක නිමිත්තකට නව ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කිරීමේ හේතුව නිසා යම් අන්දමකින් හානිකර බලපෑමක් නොවිය යුතු අතර, ඒ සභාව සංස්ථාපනය කරනු නොලැබිණි නම් ඒ පළාත් පාලන ආයතනය විසින් ඒ නඩුව හෝ නීති කෘත්‍යය හෝ නඩුවේ හෝ නීති කෘත්‍යයේ නිමිත්ත නොකඩවා ගෙන ගියාක් මෙන්, පවත්වාගෙන යනු ලැබුවාක් මෙන් සහ බලාත්මක කරනු ලැබුවාක් මෙන්, ඒ පළාත් පාලන ආයතනයේ අනුප්‍රාප්තිකයා වශයෙන් එම සභාව විසින් හෝ ඊට විරුද්ධව එය නොකඩවා ගෙන යාම, පවත්වාගෙන යෑම සහ බලාත්මක කිරීම කරනු ලැබිය හැකි ය.

06. යම් පළාත් පාලන ආයතනයක් විසින් එළඹෙනු ලැබුවා වූ ද නිකුත් කරනු ලැබුවා වූ ද එසේ නැතහොත් කරනු ලැබුවා වූ ද ඒ පළාත් පාලන ආයතනයේ පරිපාලන ප්‍රදේශය සඳහා නව ප්‍රාදේශීය සභාවක් සංස්ථාපනය කරන ලද අවස්ථාවේ දී පැවතියා වූ ද, ප්‍රාදේශීය සභා පනතින් පවරන ලද යම් බලතලවලට, කාර්යයන්ට, බැඳීම්වලට, වගකීම්වලට හෝ දේපළවලට බලපාන්නා වූ ද සියලු ගිවිසුම්, ඔප්පු, බැඳුම්කර, එකඟවීම්, දැන්වීම් හෝ වෙනත් සාධන පත්‍ර, එකී සභාව එකී ගිවිසුම්වල, ඔප්පුවල, බැඳුම්කරවල, එකඟවීම්වල, දැන්වීම්වල හෝ වෙනත් සාධන පත්‍රවල පාර්ශවකරුවෙකු වූ විටක මෙන් හෝ එකී සභාව විසින් එකී ගිවිසුම්, ඔප්පු, බැඳුම්කර, එකඟවීම්, දැන්වීම් හෝ වෙනත් සාධන පත්‍ර නිකුත් කරන ලද හෝ ඊට එළඹී විටෙක මෙන් එම සභාවට විරුද්ධව හෝ පක්ෂව පූර්ණ ලෙස බලාත්මක සහ බල සහිත විය යුතු අතර ඒවා සම්පූර්ණයෙන් බල සහිතව බලාත්මක කරනු ලැබීමට සහ ඒ අනුව ක්‍රියා කරනු ලැබීමට ද හැකි ය.

07. යම් ප්‍රාදේශීය සභාවක් අනුප්‍රාප්තිකයා වන්නේ යම් පළාත් පාලන ආයතනයක් සඳහා ද ඒ පළාත් පාලන ආයතනය විසින් පනවනු ලැබුවා වූ ද සභාව සංස්ථාපනය කරන ලද දිනයේ දී අයවීමට තිබිය හැකි වූ ද සියලු වරිපනම් බදු සහ බදු සභාව විසින් පනවන ලද වරිපනම් බදු සහ බදු අයකර ගන්නා ආකාරයෙන්ම බලාත්මක කිරීම සහ අයකර ගැනීම කරනු ලැබිය හැකි ය.

08. 7 වන වගන්තියේ කාර්යයන් සඳහා පළාත් පාලන ආයතනය විසින් කරන ලද හෝ යොදා ගන්නා ලද සියලු තක්සේරු කිරීම්, මෙම ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන සලස්වනු ලැබ ඇති ආකාරයෙන් නව ප්‍රාදේශීය සභාව විසින් ප්‍රතිශෝධනය කරනු ලබන තුරු නොකඩවා බලාත්මක විය යුතු ය.

09. මෙම විධාන වල සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

10 - 905

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.